ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020/01/21 |

## උද්ධමනය 2019 දෙසැම්බර් මාසයේ දී ඉහළ යන ලදී

**මතුපිට උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 6.2%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 3.5%
- මාසික වෙනස : 1.6%

**මූලික උද්ධමනය**
- ලක්ෂ්‍යමය උද්ධමනය : 5.2%
- වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 5.7%
- මාසික වෙනස : -0.3%

**ජා.පා.මි.ද. වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනසෙහි විචලනය**




**ජා.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය**




ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2019 නොවැම්බර් මාසයේ පැවති සියයට 4.1 හි සිට 2019 දෙසැම්බර් මාසයේ දී සියයට 6.2 දක්වා ඉහළ යන ලදී. ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් සහ 2018 දෙසැම්බර් මාසයේ පැවති පහළ පදනම් අගය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය බලපෑම මේ සඳහා දායක විය. ආහාර කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2019 නොවැම්බර් මාසයේ දී පැවති සියයට 4.0 හි සිට 2019 දෙසැම්බර් මාසයේ දී සියයට 8.6 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි ලක්ෂ්‍යමය උද්ධමනය 2019 දෙසැම්බර් මාසයේ දී සියයට 4.2 ක් ලෙස නොවෙනස්ව පැවතුණි.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2019 නොවැම්බර් මාසයේ පැවති සියයට 3.0 හි සිට 2019 දෙසැම්බර් මාසයේ දී සියයට 3.5 දක්වා ඉහළ ගියේය.

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

ජා.පා.මි දර්ශකයෙහි මාසික වෙනස සියයට 1.6 ක් ලෙස වාර්තා වූ අතර, ඒ සඳහා හේතු වූයේ, 2019 දෙසැම්බර් මාසයේ දී පැවති අයහපත් කාලගුණික තත්ත්වයේ බලපෑමෙන් ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි දක්නට ලැබුණු ඉහළ යෑම් පමණි. ආහාර කාණ්ඩයෙහි එළවළු, සහල්, රතු ළූණු, පොල් සහ මාළු මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා විය. මේ අතර, 2019 දෙසැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් ක්‍රියාත්මක කළ බදු පහළ දැමීම් හේතුවෙන්, සන්නිවේදන; නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන; සෞඛ්‍ය; සහ විවිධ භාණ්ඩ හා සේවා යන උපකාණ්ඩයන්හි අයිතමවල මිල ගණන් පහළ යෑම මගින් ආහාර නොවන කාණ්ඩයෙහි අයිතමවල මිල ගණන්හි පහළ යෑමක් වාර්තා විය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2019 නොවැම්බර් මාසයේ දී පැවති සියයට 5.5 හි සිට 2019 දෙසැම්බර් මාසයේ දී සියයට 5.2 දක්වා පහළ ගියේය. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2019 නොවැම්බර් මාසයේ දී පැවති සියයට 5.6 හි සිට 2019 දෙසැම්බර් මාසයේ දී සියයට 5.7 දක්වා ඉහළ ගියේය.

## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2017 | දෙසැම්බර් | 126.6 | 123.8 | 0.2 | 0.0 | 7.3 | 2.7 | 7.7 | 4.9 |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |
| | ඔක්තෝබර් | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 | 3.3 | 2.4 |
| | නොවැම්බර් | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 | 2.7 | 2.4 |
| | දෙසැම්බර් | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |
| | ජූලි | 129.4 | 133.4 | 0.2 | 0.3 | 2.2 | 6.1 | 1.9 | 4.7 |
| | අගෝස්තු | 129.7 | 133.7 | 0.2 | 0.2 | 3.4 | 5.9 | 2.0 | 5.0 |
| | සැප්තැම්බර් | 130.6 | 134.0 | 0.7 | 0.2 | 5.0 | 5.6 | 2.3 | 5.2 |
| | ඔක්තෝබර් | 131.9 | 134.4 | 1.0 | 0.3 | 5.6 | 5.6 | 2.8 | 5.4 |
| | නොවැම්බර් | 132.9 | 134.6 | 0.8 | 0.1 | 4.1 | 5.5 | 3.0 | 5.6 |
| | දෙසැම්බර් | 135.0 | 134.2 | 1.6 | -0.3 | 6.2 | 5.2 | 3.5 | 5.7 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව